**නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-----------------------------------------------**

**01 . මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**
**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 24 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**-----------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් 2014 වර්ෂයේදී සභාවට ලබාදී තිබෙන ගැල්වනයිස් බට 696 ක වටිනාකම වූ රු.770,472 ක් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වශයෙන් දක්වා නොතිබුණි.

(ආ) RD 2134 ට්‍රැක්ටරයේ වටිනාකම වූ රු.1,050,000 දෙවරක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් වීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් ලේඛනයේ රු.638,000 ක් වටිනාකම වූ අංක 49-9177 දරන ට්‍රැක්ටරය මූල්‍ය ප්‍රකාශනවල රු.65,000 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් රු.573,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**02. මූල්‍ය සමාලෝචනය**
**-----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**
**---------------**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.6,387,028 ක්වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ඌණතාවය රු.6,349,495 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 මුද්දර ගාස්තු**

2013,2014 හා 2015 වර්ෂවලට අදාලව එකතුව රු.17,933,740 ක්වූ හිඟ මුද්දර ගාස්තු ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් බල ප්‍රදේශය තුල "තුරුලිය සෙවන" හා "ජයබිම" නමින් නිවාඩු නිකේතන 02 ක් පවත්වාගෙන යනු ලබන අතර එම නිවාඩු නිකේතන දෙකෙහි සමාලෝචිත වර්ෂය තුල එකතුව රු.586,170 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණු අතර එම අලාභය සභා අරමුදලට වැය බරක් වී තිබුණි.

(ආ) 2014 වර්ෂයේදී දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සභාවට ලබාදී තිබෙන වටිනාකම රු.770,472 ක්වූ ගැල්වනයිස් කොඩිකණු 696 කින් රු.461,619 ක් වටිනා කොඩිකණු 417 ක් අස්ථානගත වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් වූ පරීක්ෂණ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව සභාව සතුව පවතින පරිගණක යන්ත්‍ර, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභාවේ සේවය කර, වසර ගණනාවකට පෙර මියගිය, විශ්‍රාමගිය, සේවය අත්හැර ගිය හා ස්ථානමාරු ලැබූ සේවකයන්/ නිලධාරීන් 21 දෙනකුගෙන් සභාවට අයවීමට තිබෙන එකතුව රු.102,122 ක්වූ මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

**3.2 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

"2009 වර්ෂයට පෙර සිට පදනමකින් තොරව පවත්නා වත්කම් " වශයෙන් සඳහන් කරමින් එකතුව රු.12,020,989 ක්වූ වත්කම් අගයක් ජ'නල් සටහන් මගින් ගිණුම්වලින් ලියාහැරීමට සභා තීරණයක් ගෙන තිබුණු අතර ඒ සඳහා අදාල විෂයභාර අමාත්‍යවරයාගේ සහ පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**04. පද්ධති හා පාලනය**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය